# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1948/38 – 2016 ජනවාරි 07 වැනි බ්‍රහස්පතින්දා – 2016.01.07

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස – ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

38 වැනි වගන්තිය (අ) අතුරු විධානය යටතේ ආඥාව

**2016 අංක 03 දරන ආඥාව**

මගේ යොමු අංකය: 4-3/09/2015/WS/93.
ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය: VE/DS/LLD/LA/IRUP/13.

ඉඩම් අත්කර ගැනීමේ පනතේ (460 වැනි පරිච්ඡේදය) 38 වැනි වගන්තියේ (අ) අතුරු විධානයෙන් මා වෙත පවරා ඇති බලතල අනුව, ඉඩම් අමාත්‍ය මුනසිංහ කාරියවසම් අප්පුහාමිලාගේ දොන් සෝමදාස ගුණවර්ධන වන මම පහත සඳහන් උපලේඛනයේ 1 වැනි ඡේදයේ සඳහන් ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියාට නැතහොත්, එකී නිලධාරියා විසින් ඒ සඳහා බලය දෙන ලද වෙනත් නිලධාරියකුට, එම උපලේඛනයේ 2 වැනි ඡේදයේ දැක්වෙන නියමිත ඉඩම ස්වාමිත්වයට ගැනීමට මෙයින් නියම කරමි.

එම්. කේ. ඒ. ඩී. එස්. ගුණවර්ධන,
ඉඩම් අමාත්‍ය.

2016 ජනවාරි මස 06 වැනි දින,
ඉඩම් අමාත්‍යාංශය,
'මිහිකත මැදුර',
රජමල්වත්ත පාර,
බත්තරමුල්ල.

උපලේඛනය

1. **ඉඩම් අත්කර ගැනීමේ නිලධාරියා.**– ප්‍රාදේශීය ලේකම්, වලිකාමම් – නැගෙනහිර

2. **ඉඩමේ විස්තරය.**– උතුරු පළාතේ, යාපනය දිස්ත්‍රික්කයේ, වලිකාමම් නැගෙනහිර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, ඉරුපලෙයි දකුණ J/257 ග්‍රාම නිලධාරී කොට්ඨාසයේ, ඉරුපාලෙයි ගමේ පිහිටි, යාපනය ජ්‍යෙෂ්ඨ මැනුම් අධිකාරී විසින් පිළියෙල කරන ලද අංක Ya/KPY/2015/217 හා 2015.09.28 දිනැති ප්‍රගමන අනුරේඛනයේ සඳහන් ප්‍රමාණයෙන් හෙක් 0.2339ක් පමණ වන පහත සඳහන් නමින් හා ප්‍රමාණයෙන් යුත් ඉඩම් කොටසට මායිම්:

**01. කැබලි අක්ෂර 'A' – කඩ්ඩුවාසල් සහ තලයඩි – ප්‍රමාණය: හෙක්. 0.2339 ක් පමණ**

උතුරට: මානික්කම් බාසුපදි සහ රාමලිංගම් සෙල්ලයියා හිමිකම් කියන ඉඩම; නැගෙනහිරට: රාමලිංගම් සෙල්ලයියා සහ පොන්නයියා රත්නසභාපති හිමිකම් කියන ඉඩම; දකුණට: පොන්නයියා රත්නසභාපති හිමිකම් කියන ඉඩම සහ භාරති පටුමග; බටහිරට: භාරති පටුමග සහ මානික්කම් බාසුපදි හිමිකම් කියන ඉඩම.

01 - 808


1A – G 22837 – 32 (2016/01)

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අතිවිශේෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.